ඉල්ලුම දැනට ඝන මීටර දස ලක්ෂයක් වුවද 2000 වසරේදී එම ප්‍රමාණය දෙගුණ වී දෙලක්ෂයක් දක්වා වැඩි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මූළු දැව ප්‍රමාණයෙන් දළ වශයෙන් 42% ක් පමණ රජය විසින් පාවිච්චි කරනු ලබන අතර 35% පමණ ඉදි කිරීම් කර්මාන්තය සඳහාත්, ගෘහ භාණ්ඩ සඳහා 19% ක්ද, වෙනත් නිෂ්පාදන කර්මාන්තවලට 4% ක්ද උපයෝගී කර ගනු ලැබේ. 2000 වසර වන විට ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා උපයෝගී කර ගනු ලබන දැව ඝන මීටර කෝටි 20 ක පමණ හිඟයක් ඇති විය හැකි බවට ඇස්තමේන්තු කර ඇත.

සෙසු කෘෂි කර්මාන්ත ව්‍යාපෘති අතර කෘෂිකර්මය, මල් වැවීම, ඖෂධීය පැළෑටි වැවීම සහ අපනයන කිරීමද ඇතුළත් වේ.

**මේ හැර ලංකාවේ ජාතික ආදායමෙන් තවමත් ඉතා වැදගත් අංශයක් ලෙස කෘෂි කර්මාන්තය අංශ වැදගත් වීම මෙන්ම සේවා නියුක්ති සංඛ්‍යාවෙන් විශාල කොටසක් කෘෂි කර්මාන්තයෙන් යැපෙන නිසාත් අපනයන ආදායමෙන් වැඩි කොටසක් කෘෂිකර්මාන්තයෙන් උපයන නිසාත්, කෘෂි ආශ්‍රිත කර්මාන්තයේ වැදගත්කම දිනෙන් දින වැඩි වේ. කර්මාන්ත අංශයේ වැඩි කොටසක් කෘෂි ආශ්‍රිත නිපදවීම් විශේෂයෙන් ආහාර, බීම, දුම්කොළ ආශ්‍රිත කර්මාන්ත වීම දේශීය කෘෂි කර්ම නිෂ්පාදනය, පිරිසැකසුම් කිරීම හා අලවියෙහි වැදගත් වීම කෘෂි ආශ්‍රිත කර්මාන්තයේ වැදගත්කම තව දුරටත් මොනවට පැහැදිලි කරයි. ශ්‍රී ලංකාව තුළ කෘෂි ආශ්‍රිත කර්මාන්ත පිහිටුවීම නිසා ඇතිවිය හැකි ඵල ප්‍රයෝජන සංක්ෂිප්තව පහත දක්විය හැකිය.**

**ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා පවතින පසුබිම**

කෘෂි කර්මාන්ත අංශය දැනට නොයෙකුත් බාධක වලට මුහුණ පා ඇත්තේය.

(1) වෙළඳාම, වාණිජ කටයුතු සහ නාගරික දේපල සංවර්ධනය සමඟ සසඳා බලන විට කෘෂි කර්මාන්ත වල ආයෝජනයන් ලැබෙන ලාභය සාපේක්ෂ වශයෙන් අඩුය.

(2) ඉඩම් සීමා කිරීමේ ප්‍රතිපත්තිය නිසා ප්‍රමාණය අතින් ආර්ථික බලපෑමක් ඇත.

(3) ඇතැම් අත්‍යවශ්‍ය යෙදවුම් වල ආනයන බදු වැඩිකම.

(4) දේශීය කර්මාන්ත වලට සැලකිය යුතු ආරක්ෂාවක් නොසැලසෙන නිදහස් වෙළඳාම.

(5) විදුලි බලයෙහි සිට ශීත ගබඩා දක්වා සේවාවල ඉහළ යෙදවුම් වියදම්.

(6) බැංකු කරුවන් සහ ව්‍යවසායකයන් මෙබඳු ගණයේ ආයෝජන ඉහළ අවදානම් සහිත දේවල් ලෙස වර්ග කර තිබීම.

(7) සකස් කිරීමේ ශිල්ප ක්‍රම සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම හිඟකම.

(8) දිරි ගැන්වීම, වෙළඳ පොල අවස්ථා, විකල්ප තාක්ෂණයන් ආදිය පිළිබඳ තොරතුරු නොමැතිකම.

(9) සංචාරක ව්‍යාපාරය වැනි බදු සහන සහිත අංශ වලින්, වැඩි අවදානමක් ඇති කෘෂි කර්මාන්ත අංශ වල ව්‍යවසායකයන් ඇද ගැනීම සඳහා විශේෂ දිරිගැන්වීම් නොමැති වීම.

(10) මිලට සහාය වීමේ යෝජනා ක්‍රම නොමැති කම ඇතුළු අලෙවි කරණ හා බෙදා හැරීමේ කට යුතු ප්‍රමාණවත් නොවීම.

(11) ආසියාතික රටවල ඇති අඩු වියදම් සහිත උචිත තාක්ෂණ ක්‍රම නොමැතිකම නිසා වියදම් වැඩි තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීමට සිදුවීම.

(11) පහසු ආයෝජන ණය පහසුකම් නොමැතිකම.

(13) කෘෂි කර්මාන්ත ආයෝජන සඳහා යම් ප්‍රතිපත්ති මාලාවක් නොමැතිකම.

(14) මෙම අංශයේ ආයෝජනයට ඉදිරිපත් වන්නන් කෙරෙහි ක්‍රියා පරිපාටි හා පරිපාලනමය අතින් බාධක පැමිණීම සහ මේ අංශයේ කටයුතු වලට සම්බන්ධිත රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම.

(15) කෘෂි කර්මාන්ත සංවර්ධනය කිසි යම් එක් අමාත්‍යාංශයක වගකීමක් නොවේ. කෘෂිකර්ම අමාත්‍යාංශය අවධානය යොමු කර ඇත්තේ නිෂ්පාදනය සහ පර්යේෂණ කටයුතු පිළිබඳවය. වගා කිරීම, සකස් කිරීම සහ වෙළඳාම වැනි විශේෂ අංශ ගැන සෙසු අමාත්‍යාංශ සම්බන්ධ වී ඇත. නියෝජිත ආයතන සහ වතු අවධානය යොමු කර ඇත්තේ යටත් විජිත නිෂ්පාදන ක්‍රියාවලිය කෙරෙහි වන අතර එතරම් වැදගත් නවීකරණයන් අවශ්‍ය නොවන කර්මාන්ත මධ්‍යස්ථානවල අවශ්‍යතා සපුරාලීම පමණක් කෙරෙහි ඔවුන්ගේ උනන්දුව යොමු වී ඇත. මෙම අංශය දියුණු කිරීම පිළිබඳ මූල් අරමුණ ගැන සැලකිල්ල යොමු වී නැත.

(16) ණය දෙන ආයතන විසින් තම ණය ප්‍රතිපත්ති සකස් කර ඇත්තේ කෘෂි සැපයුම් කර්මාන්ත වලට වඩා ආනයන - අපනයන වෙළෙඳාමට ණය මුදල් ප්‍රදානය කිරීම සඳහාය.



(කිලිනොච්චි - ලීටර 20,000; ගාල්ල ලීටර 10,000) නෙස්ලේ සමාගමට අයත් පොළොන්නරුව උකු කිරි කම්හලේ ලීටර 50,000 ක ධාරිතාවක් ඇතත්, එහි වත්මන් නිෂ්පාදනය ලීටර 26,008කි. පන්නල පිහිටි කම්හලේ ලීටර 240,000 ධාරිතාවක් සැලසුම් කර ඇත. ලංකා මිල්ක් පුඩ්ස් සමාගමට කොළඹ ලීටර 1,120,000 ක් නැවත ඇසිරීමේ ධාරිතාවක් ඇති යන්ත්‍ර සූත්‍ර ඇතත් දැනට නිෂ්පාදනය වන්නේ ලීටර 375,000 ක් පමණකි. අනිකුත් අයට ලීටර 75,000 ක ධාරිතාවක් ඇතත් දැනට නිෂ්පාදනය කරනු ලබන්නේ ලීටර 50,000 ක් පම ණකි. මෙයින් අදහස් වන්නේ ලීටර 1,685,000 ක මුළු ධාරිතාවක් තිබියදී දැනට නිෂ්පාදනය කරනු ලබන්නේ ලීටර් 581,500 ක් පමණක් බවත් ලීටර 270,000 ක ධාරිතාවක් සැලසුම් කර තිබෙන බවත්ය. පවත්නා ධාරිතාවන් ප්‍රයෝජනයට ගැනීමට නම් කිරි නිෂ්පාදනය වැඩි කිරීම අවශ්‍යය. දැනට උකු කිරි, කිරි පිටි, හෝ කල් කිරි නිෂ්පාදන අයිස් ක්‍රීම් බෝතල් වල අසුරන ලද විෂ නැසූ කිරි, කිරි, බටර්, යෝගට්, චීස් හෝ ගිතෙල් යන කිරි ආහාර වර්ග මෙරට නිපදවනු ලබන අතරම ආයනයන කිරීමද කරනු ලැබේ. 1984 දී කිරි පිටි සහ වෙනත් කිරි නිෂ්පාදන වර්ග ආනයනය ම සඳහා රුපියල් කෝටි 65.6 ක් වැය වී ඇත.

මස්, මස් නිෂ්පාදනය, බිත්තර, කුකුල් පාලනය සහ කෘෂි පදනමක් ඇති කර්මාන්ත ශ්‍රී ලංකාවේ තිබෙන නමුදු මේ අංශයෙහි ඉතා විශාල විභවතාවක් ඇත.

**මිරිදිය මසුන් ඇති කිරීම**

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරයේ පිහිටි ජල සම්පත් මෙවැනි කෘෂි ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීමට ඇති වටිනා සම්පතක් වෙයි.

| මිරිදිය සම්පත | හෙක්ටෙයාර් පරිමාව |
|---|---|
| ප්‍රධාන වාරිමාර්ග ක්‍රම | 70,850 |
| මධ්‍යම පරිමාවේ වැව් | 17,004 |
| සුළු වාරිමාර්ග වැව් | 39,271 |
| කඳුරට පිහිටි කුඩා දිය කඩිති | 8,097 |
| විල්ලු | 4,049 |
| | 139 271 |
| මහවැලි ජලාශ | 22,670 |
| | 161 941 |

**කිවුල් ජලය**

| | |
|---|---|
| ගැඹුරු කලපු සහ මෝය | 80.000 |
| නොගැඹුරු කලපු සහ මෝය | 40,000 |
| | 120,000 |

මේ ජලාශ වල තිලාපියා, කාප්,මල් කොරළි, හිරිකණයා, ටර්වුට් වැනිමසුන් ද මිරිදිය ඉස්සන් ඇති කිරීමටදහැකි වෙයි. මේ හැර විසිතුරු මසුන් ඇති කිරීමට ද හැකිවෙයි. මේ සම්පත් පදනම් කර ගෙන කරවල, සත්ව ආහාර,වියළි කරන ලද ඉස්සන් ආදිය නිපදවිය හැක

**වන සම්පත්**

වන සම්පත් සහ වන සම්පත් මත පදනම් වූ කෘෂි කර්මාන්ත ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන තවත් අංශයකි. ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය මගින් වන සම්පත් කටයුතු හෝ වන සම්පත් කළමනාකරණය හෝ (ලංකා දුම්කොළ සමාගම මගින් කර ගෙන යන කුඩා වන ව්‍යාපෘතිය හැරුණ විට) සිදු කරනු නොලැබේ. වන සම්පත් සමීක්ෂණය (1956) පෙන්වා දෙන පරිදි අක්කර කෝටි 3.22 ක් හෝ ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් 44% ක්ම වන සම්පත්ය. එහෙත් ශීඝ්‍ර ලෙස කැලෑ සැපීම, ගිනි ගැනීම, සැලසුම් කළ කෘෂි කාර්මික ව්‍යාපත්ති ආදිය නිසා දැනට වන සම්පත් ප්‍රමාණය රටේ මුළු බිම් ප්‍රමාණයෙන් 25% පමණ දක්ව අඩු වී ඇත. 1982 දී නැවත කැලෑ සිටුවීම අවුරුද්දකට අලුතින් අක්කර 30,000 ක් පමණ වගා කළ යුතු වෙයි. කාර්මික භාණ්ඩ සඳහා මුළු දැව



16 වැනි පිටුව බලන්න →